ශ්‍රී ලංකා සංවර්ධන පර්පාලන ආයතනය - 2010

------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා සංවර්ධන පර්පාලන ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංවර්ධන පර්පාලන ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

-----------------------------------------

#### 1.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

(අ) උපදේශක පාඨමාලා වෙනුවෙන් ගෙවිය යුතු ගිණුම් වල දැක්වෙන රු.31,263,459 ක් වූ ශේෂය තුල අන්තර්ගතව ඇති සිංහල හා දෙමළ වැඩසටහන් මෙහෙයවීම වෙනුවෙන් 2007 හා 2008 වර්ෂවලට අදාලව ආයතනයේ ආදායමට මාරු කළ යුතුව තිබූ රු.5,347,485 ක මුදල ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිත අංක 10 යෙහි 6 වැනි වගන්තියට අනුකූලව ආදායමට මාරු නොකර ගෙවිය යුතු වියදම් ලෙස දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාර දැනට භාවිතයේ පවතින එහෙත් සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වූ ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගලපා නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩු පාඩු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන කාර්තුවේ දී ආරම්භ කරණ ලද වැසිකිලි නවීකරණය කිරීමේ කටයුතු එම වර්ෂය අවසානය වන විටත් නිමකර නොතිබියදී ඒ සඳහා දරන ලද රු.3,315,594 ක් වූ වියදම කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමට හර කරනු වෙනුවට සදොස් ලෙස ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

(ආ) නව නේවාසික ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනමේ දී ආරක්ෂිත තැන්පත් ලෙස ගෙවන ලද රු.889,000 ක් වූ මුදල ආරක්ෂිත තැන්පතු ගිණුමට හර කිරීම වෙනුවට කෙරිගෙන යන වැඩ ගිණුමට හර ර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආයතනයෙ විදේශ ගමන් වියදම් රු.396,732 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.3. විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

ශේෂ සනාථ කිරීම, උපදේශකවරුන්ගේ වාර්තා (Report Writing), යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛන, වයස් විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන, ඉදිරිපත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.265,712,571 ක් වූ වත්කම්, බැරකම් , ආදායම් හා වියදම් සතුටුදායක ලෙස විගණනය කිරීමට නොහැකි විය.

1.2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති ,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය කරන ලදී.

| **නීති,රීති , රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1982 අංක 09 දරණ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතන පනතේ | |
| 13.1 වගන්තිය | පාලක සභාවේ රැස්වීම් සෑම මාසයකටම යටත් පිරිසෙයින් එක් වරක්වත් පවත්වනු ලැබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී පාලක සභාව රැස්වී තිබුණේ හත් වරක් පමණි. |
| (ආ) 2006 අංක10 දරණ දේශිය ආදායම් පනතේ 153 වන වගන්තිය | පනතේ නියමයන් ප්‍රකාර නව ගොඩනැගිලි සංකීර්ණය වෙනුවෙන් 2006 සිට 2008 කාලය වෙනුවෙන් ගෙවන ලද රු.6,659,708 ක් වූ උපදේශන සේවා ගාස්තු සම්බන්ධයෙන් වූ රු.332,985 ක් රඳවා ගැනීමේ බදු අයකර දේශිය ආදායම් කොමසාරිස්වරයාට ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) 2003/06/02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී/12 | |
| (i) 7.4.1 ඡේදය | විගණන කමිට අවම වශයෙන් මාස තුනකට වරක්වත් රැස්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ දී කමිටුව එක් වරක් පමණක් රැස්වී තිබුණි. |
| (ii) 9.2 (ඕ) | ආයතනයේ සංවිධාන සැලැස්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.480,323 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය  රු.1,365,892 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලවල රු.885,569 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයතනයේ මෙහෙයුම් ආදායම රු.26,543,326 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

#### 2.2.1 කාර්ය සාධනය

------------------

මේ  සම්බන්ධව පහත කරුණු අනාවරණය විය.

සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් මුළු දේශන පැය 10,073ක් මෙහෙයවා තිබුණි.ඉන් පැය 4,972 ක ප්‍රමාණයක් ආයතනයේ ස්ථිර හා කොන්ත්‍රාත් පදනමට සේවය කරන උපදේශකයින් විසින් පවත්වා තිබූ අතර දේශන පැය 5,101 ක් බාහිර උපදේශකයන් විසින් පවත්වා තිබුණි. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දේශන පැය ගණන 18,535 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේදී දේශන පැය 8,462 ක අඩු වීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනයේ කාර්ය සාධනය මෙලෙස පසුබැමකට ලක්වීම  මෙහෙයුම් අතිරික්තය අඩුවීම කෙරෙහිද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(i) සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ  මෙහෙයුම් පාඨමාලා සංඛ්‍යාව 106 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙය වූ මුළු පාඨමාලා සංඛ්‍යාව 137 ක් විය. ඒ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ පාඨමාලා සංඛ්‍යාව 31කින් අඩු වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ උපලේඛණගත වැඩසටහන්වල කාර්ය සාධනය 2009 වර්ෂයට සාපේක්ෂව පහත පරිදි විය.

| වර්ෂය | උපලේඛනගත වැඩසටහන් සංඛ්‍යාව | නිමකල වැඩසටහන් සංඛ්‍යාව | කල්දැමූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2009 | 74 | 58 | 20 | 1500 |
| 2010 | 87 | 33 | 54 | 887 |

2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ නිමකළ වැඩසටහන් සංඛ්‍යාවේ අඩුවීම 43% ක් විය. සමාලෝචිත වර්ෂයේ ආයතනය විසින් මෙහෙයවීමට අපේක්ෂිත පුහුණු වැඩ සටහන් 87 ක් (scheduled programme) වෘත්තීය සංවර්ධන කේන්ද්‍ර 11 යටතේ උපලේඛන ගත කර තිබුණි. මෙම කේන්ද්‍ර අතරින් ඵලදායිත්වය හා ගුණත්වය සඳහා වූ කේන්ද්‍රයේ සහ පර්යේෂණ, ප්‍රකාශන හා ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රයේ කිසිදු කාර්ය සාධනයක් සිදු වී නොතිබුණි.

මේ අනුව උපලේඛණගත වැඩ සටහන් වල කාර්ය සාධනය 37.9% ක තරම් පහල අගයක් ගෙන තිබුණි.

(iii) කාර්ය මණ්ඩල හිඟකම සහ කාර්ය සාධනය සම්බන්ධව අවධානය අඩුකම නිසා පහත දැක්වෙන පරිදි වෘත්තීය සංවර්ධන කේන්ද්‍ර කීපයක කාර්ය සාධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩාල වී තිබුණි.

| **කේන්ද්‍ර** | **2010** | | **2009** | | **2009 වර්ෂයට සාපේක්ෂව කාර්යසාධනය අඩුවීමේ ප්‍රතිශතය** | |
|---|---|---|---|---|---|---|
| | **වැඩසටහන් ගණන** | **පැය ගණන** | **වැඩසටහන් ගණන** | **පැය ගණන** | **වැඩසටහන් ගණන** | **පැය ගණන** |
| භාෂා අධ්‍යයන | 08 | 1,233 | 15 | 2,661 | 47 | 54 |
| තොරතුරු තාක්ෂණ | 10 | 713 | 22 | 1,958 | 55 | 64 |

## 2.2.2 ජාත්‍යන්තර කම්කරු සංවිධාන (අයි එල් ඕ ) ව්‍යාපෘතිය

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

ජාත්‍යන්තර කම්කරු සංවිධාන ආධාර යටතේ ව්‍යාපාර සංවර්ධනය වෙනුවෙන් වඩාත් හොඳ සේවාවන් සැලසීම සඳහා රාජ්‍ය නිලධාරීන්ට ව්‍යාපාර රෙගුලාසි පිළිබඳව අවබෝධයක් ලබාදීමේ වැඩසටහන් 97 ක් මෙහෙයවීමට හා ඊට අදාලව කලමනාකරණ උපදේශක සේවා සැපයීමට 2007 වර්ෂයේ දි ඉහත අනුග්‍රාහක ආයතනය එකඟ වී තිබුණු අතර එම ආයතනය ඒ සඳහා රු.8,620,447 ක මුදලක් මුදාහැර තිබුණි. 2008 අවසානයේ දි මෙම ව්‍යාපෘතිය නිම කර තිබුණද ගිණුම් අනුව නිම වී තිබූ වැඩ සඳහා ගෙවීමට තිබූ වියදම ලෙස රු. 4,794,300 ක් ඉදිරියට ගෙනවිත් තිබුණ. එය මේ දක්වා නිරවුල් කර නොතිබුණි. කෙසේ නමුත් මේ පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2.2.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

### 2.2.3.1 නව ගොඩනැගිලි සංකීර්ණය

-----------------------------------

අංක 3/ ඒඩී/3-1 හා 2008 ජුලි 15 දිනැති කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපිය අනුව රු.60,353,410 ක් වටිනා නව ගොඩනැගිලි සංකීර්ණයේ පළමු අධියර ඉදිකිරීම් 2008 අගෝස්තු 20 දින ආරම්භ කර මාස 20 කින් අවසන් කළ යුතුව තිබුණි. තවද 2008 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත්කරන ලද ලිපිය අනුව නේවාසික ගොඩනැගිල්ල 2009 වර්ෂයෙදි නිමකළ යුතුව තිබුණි.කෙසේ වෙතත්, මේ වනවිට අවුරුදු 3 කට ආසන්න කාලයක් ගතවී තිබුණද නේවාසික ගොඩනැගිල්ල නිමකොට භාරදීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්වී තිබුණි.

### 2.2.3.2 නේවාසිකාගාරයේ ඇති වැසිකිළි පද්ධතිය අලුත්වැඩියාව

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ආයතනයේ නේවාසිකාගාරයේ ඇති වැසිකිළි 74 ක් අලුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත්ත සමාගමක් සමඟ 2007 දෙසැම්බර් 31 දින රු.19,416,032 ක් වටිනා ගිවිසුමකට එළඹ තිබුණි. මේ අනුව අදියර තුනකින් වැඩ ක්‍රියාත්මක කර 2008 ජුලි 30 දිනට සියලු වැඩ නිමකර භාරදිය යුතුව තිබුණි. 2010 ජනවාරි 10 දිනට කළ වැඩවල සහතික කල වටිනාකම රු.12,454,513 වු අතර මේ සඳහා රු.9,066,557 ක් ගෙවා තිබුණි. එහෙත් කොන්ත්‍රාත් සමාගම කාලය දීර්ඝ කිරීම් කිහිපයකින් පසු වැසිකිළි 58 ක වැඩ පමණක් නිමකර 2009 වර්ෂය අවසානයට භාර දී තිබුණි. 2011 මැයි 31 විගණන දින වන විටත් ඉතිරි වැසිකිළි 16 ක වැඩ නිමකර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම කඩ කරමින් වැඩ නවතා දමා තිබුණෙන් නේවාසිකාගාරයේ කාමර 13 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර දෙකකට අධික කාලයක් නිශ්කාර්යව වසා දමා තිබුණි.

(ඇ) ගිවිසුම් කඩ කිරීම සම්බන්ධව කොන්ත්‍රාත්කරුට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර ඉතිරි වැසිකිළි 16 නවීකරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල කැඳවීම් මැතදී ලබාගෙන තිබුණද වාර්තාවේ දින දක්වා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන නොතිබුණි.

## 2.2.4 කළමණාකරන අකාර්යක්ෂමතා

---------------------------------------

ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 515 ව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව මූලික වියදම් දරා වැඩ ආරම්භකර තිබිය දී ආයතනය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගොඩනැගිලි සංකීර්ණයේ පළමු අධියර වූ නේවාසිකාගාර ගොඩනැගිල්ල පමණක් ඉදිකිරීමට තිරණය විය. නේවාසික ගොඩනැගිල්ල ඉදිකිරීම පමණක් කොන්ත්‍රාත්කරුට පවරා තිබියදී කොන්ත්‍රාත්කරුට පවරා නොමැති පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික කටයුතුද ආරම්භ කිරීම නිසා ආයතනයට පහත දැක්වෙන පාඩු සිදු වී තිබුණි.

(i) 2007 වර්ෂයේ දී රු.594,329 වැයකර ඉදිකර තිබූ වැසිකිළි පද්ධතියට හානි නොවන ආකාරයට නේවාසිකාගාර ගොඩනැගිල්ලේ සැලැස්ම වෙනස්කිරීම නිසා බිම් මහලේ වර්ග අඩි 500කට ආසන්න ප්‍රමාණයක් අපතේ ගොස් තිබුණි. කෙසේ වෙතත් ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වලදී වැසිකිළි පද්ධතියට හානි වීම නිසා මේවන විට වැසිකිළි පද්ධතියද කඩා ඉවත්කර තිබුණ.

(ii) රියදුරු නේවාසිකාගාරය හා පන්ති කාමර දෙකක් කඩා ඉවත් කිරීමට සිදුවී තිබුණි.

(iii) ඉදිකිරීම් අත්හැර දැමූ පරිපාලන ගොඩනැගිල්ලේ අත්තිවාරම් කැපීම සඳහා භූගත විදුලි සැපයුම් කේබලය පවතින ස්ථානයෙන් ඉවත් කර යෝජිත ගොඩනැගිල්ලට අවහිර නොවන සේ යෙදීම වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයට රු. 430,340 ක අමතර වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(iv) යෝජිත ගොඩනැගිල්ල වෙනුවෙන් මුළු වර්ග ඵලය මත නාගරික සංවර්ධන අධිකාරියට හා කොළඹ මහ නගර සභාවට සේවා ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.3,714,000 ක් හා රු.292,709 ක් ගෙවා තිබුණද ඉදිකිරීම අත්හැර දමන ලද පරිපාලන ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවන ලද රු. 2,615,738 ක් වූ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## 2.2.5 නිශ්ක්‍රිය වත්කම්

----------------

ආයතනය විසින් රු.2,631,220 වැය කර එකවර පනස් දෙනෙකුට භාෂා පරිවර්තන පහසුකම් ලබා දිය හැකි නවීන සම්මන්ත්‍රණ හා භාෂා පරිවර්තන උපකරණ කට්ටලයක් මිලදී ගෙන තිබුණ ද එම ඒකකයකට අවශ්‍ය භාෂා පරිවර්තකයින් බඳවා ගෙන නොතිබුණෙන් ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා භාෂා පරිවර්තන උපකරණ යොදා ගත නොහැකිවී තිබුණි.

## 2.2.6 ආර්ථික නොවන ගනුදෙනු

----------------------------

සමාලොචිත වර්ෂයේදි ඔස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලයේ පැවැති නායකත්ව පුහුණු වැඩ සටහනකට සහභාගිවූ නිලධාරිනියක වෙනුවෙන් රු.50,491 ක් වැයකර තිබූ අතර අනුග්‍රහක ආයතනය විසින් ඉතිරි සියලු වියදම් දරා තිබුණි. 2009 මාර්තු 02 දින සේවයට බැදී ඇති මෙම නිලධාරිනිය 2010 නොවැම්බර් 04 දින සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි. කිසිදු ඇප බැදුම්කරයක් නොමැතිව කෙටි සේවා කාලයක් ඇති අයකු විදේශ පුහුණුව සඳහා  යැවීම වෙනුවෙන් දරනලද වියදම් නිෂ්ඵල වී තිබුණි.

## 2.2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

දේශන පැවැත්වීම ඇතුළු විවිධ කාර්යන් සඳහා සමලෝචිත වර්ෂය තුල දී ආයතනයේ ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන  උපදේශකයින්ට රු. 6,763,742 ක මුදලක් ගෙවා තිබුණි. 2007 අගෝස්තු 21 වන දින ගරු අමාත්‍යවරයාගේ නිර්දේශය මත භාණ්ඩාගාරය මගින් අනුමත කරන ලද බාහිර සේවා සැපයීම් සම්බන්ධයෙන් වූ ගෙවීම් පිළිවෙත අනුව මෙම ගෙවීම් කර තිබූ බව දක්වා තිබුණද එකී සියලු සේවාවන් සපයා තිබුණේ ස්වකීය දෛනික රාජකාරි කාලය තුලදීය. ඒ අනුව,  මෙම ගෙවීම් ආයතනය ස්ථාපිත කරන ලද පනතේ 3 (1) වගන්තියේ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීම් වෙනුවෙන් වන බැවින් එකී කාර්යන් සඳහා අමතර ගෙවීම් කිරීම මතබේදාත්මක වී තිබුණි.

## 2.2.8 හඳුනා ගත් පාඩු

---------------------

2004 සිට 2007 දක්වා කාලය තුල නේවාසිකාගාරයේ නවාතැන් ගෙන තිබූ නිලධාරීන් 05 ක් හා බාහිර ආයතනයකින් අයවිය යුතුව තිබූ රු.633,150 ක් නේවාසිකාගාර පරිපාලනයේ දුර්වලතාවයන් නිසා අයකර ගත නොහැකිව පැවතුණි.

2.2.9 අභ්‍යන්තර විගණනය

----------------------

රජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ආයතනය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන්ද අපේක්ෂිත කාර්යන් ඉටුවී නොතිබුණි. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සදහා අභ්‍යන්තර විගණන තනතුරක් ඇති කිරීමට කළමනාකාර දෙපාර්තමේන්තුව විසින් 2008 අප්‍රේල් 22 දින අනුමැතිය දී තිබුණද 2011 මැයි මාසය වන විටත් ආයතනය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

2.2.10 අයවැය ලේඛනමය පාලනය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර අසාමාන්‍ය විචලනයන් දක්නා ලද බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගි කරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

3. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත වරින් වර දන්වන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) පාඨමාලා පැවැත්වීම.

(ඇ) විදේශ ගමන් වියදම්

(ඈ) අභ්‍යන්තර විගණනය